## ‘අපේ ප්‍රවාද’ - අපේ ඇසින් ලොව දකින්නට

ඔබ තවමත් පාසැල් යන වයසේද? නැතිනම් උසස් පෙළ සමත්ව විශ්ව විද්‍යාලයට ඇතුළත්ව උපාධියක් හදාරන්නේද? එසේත් නැතිනම් විශ්ව විද්‍යාල වරම් නොලැබ, කළමණාකරණය, ගණකාධිකරණය වැනි වූ තෘතීයික පාඨමාලාවක් හදාරමින් සිටින්නේද? ඔබ උක්ත සඳහන් කිනම් කුලකයකට අයත් වුවත්, එසේ ඔබ ලබන්නා වූ අධ්‍යාපනයෙහි **පදනම** ගැන කෙදිනක වත් සිතා බලා තිබේද? ඇතැම් විට මෙම ප්‍රශ්නයෙහි තේරුම කුමක්දැයි ඔබ ඇසුවහොත් එය පුදුමයට කරුණක් නොවේ. එම ප්‍රශ්නය වටහා ගැනීමට ඔබට ශක්‍යතාව ලබා දෙන දැනුමක් සහ එම දැනුම ලබා ගත හැකි මාධ්‍යයක් ඔබට හඳුන්වා දීම මෙම කෙටි ලිපියෙහි අරමුණයි.

**අධ්‍යාපනයෙහි පදනම** යන්නෙන් මෙහිදී අදහස් වන්නේ කුමක්ද? එම ප්‍රශ්නයට පිළිතුර **දැනුම පිළිබඳ දැනුම** හා සම්බන්ධ වෙයි.

දැනුම පිළිබඳ දැනුම, ඥානවිභාගය (epistemology) යනුවෙන් හැඳින්වෙයි. එහිදී, අප දැනුම නිර්මාණය කරන්නේ හා දැනුම ලබාගන්නේ කෙසේද යන්න සාකාච්ඡා කෙරෙයි, ඒ පිළිබඳ ප්‍රවාද තැනෙයි. මිනිසා විසින් නිර්මාණය කෙරෙන දැනුම ඉන්ද්‍රිය පද්ධතියට, මනසට හා සංස්කෘතියට සාපේක්ෂ වන අතර එය නිර්මාණය කෙරෙන්නේ කිසියම් චින්තනයක් මත පදනම් වෙමින්ය. මෙහිදී **චින්තනය** යන්න යොදා ගැනෙන්නේ සිතීම යන අරුතට වඩා මහත් ගැඹුරු වූ අර්ථයකිනි. දැනුම පිළබඳ වූ සිංහල බෞද්ධ ප්‍රවාදයෙහිදී **චින්තනය** අර්ථ දැක්වෙන්නේ යම් කිසි සංස්කෘතියක ඇති සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, නැටුම්-ගැයුම්, කලා ශිල්ප, ආගමික කටයුතු, විද්‍යාවන් ඇතුළු සියළු දැනුම්, ආචාර ධර්ම, භාෂාව, වෙදකම, තාක්ෂණ ශිල්පය යනාදී **සියල්ල එකට බැඳ තබන හුය** යනුවෙනි. කෙටියෙන් පවසතොත් සංස්කෘතියක පදනම චින්තනය වෙයි. එනමුත් මෙහිදී සියල්ල චින්තනයට ඌනනය නොකෙරෙයි. චින්තනය, සංස්කෘතිය හා ඒවා මත පදනම්ව දැනුම නිර්මාණය කෙරෙන අයුරු යනාදී කාරණා එක එකක් විස්තර කිරීම මෙම ලිපියෙහි අරමුණ නොවෙයි. එබඳු විශිෂ්ය, ගැඹුරු දැනුමක් මෙවැනි කෙටි ලිපියකින් කිසි සේත් විස්තර කළ නොහේ. මෙම කෙටි හැඳින්වීම කරන ලද්දේ ඉහත දී නැගුණු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිණිසය.

අධ්‍යාපනයෙන් කෙරෙන්නේ යම් කිසි **දැනුමක්** ලබා දීමයි. මෙලෙස ලබා දෙන **දැනුම**, යම් කිසි චින්තනයක් මත පදනම්ව යම් කිසි සංස්කෘතියක නිර්මාණය කරන ලද්දක් වෙයි. **අධ්‍යාපනයෙහි පදනම** යන්නෙන් මෙහිදී අදහස් කරන ලද්දේ ඔබ විසින් ලබා ගන්නා **දැනුම් පද්ධතියේ පදනම** යි. අද අප රට තුළ පෙර පාසැලෙහි සිට විශ්ව විද්‍යාලය දක්වාද, විශ්ව විද්‍යාලයට පරිබාහිරව ඇති විවිධ වෘත්තීය පාඨමාලාද, පශ්චාත් උපාධි පාඨමාලා යනාදී මෙකී නොකී සියල්ල මගින් දෙන අධ්‍යාපනයන්හි පදනම, නැතහොත් **මුල්**, ඇත්තේ මෙරට සභ්‍යත්වයට හා සංස්කෘතියට ආගන්තුක වූ චින්තනයක බව ඔබ දන්නවාද? අද රටෙහි අධ්‍යාපනය ලබන බහුතරයක් දෙනා මෙයට දෙන පිළිතුර වනු ඇත්තේ “නැත” යන්නයි. (අධ්‍යාපන ක්ෂේත්‍රයේ පමණක් නොව පොදුවේ ගත් කළ අද මුළු සමාජයෙහිම දැනුම් ආධිපත්‍යය ඇත්තේ මෙම ආගන්තුක චින්තනයටයි. එනම් අද සමාජය තුළ පිළිගනු ලැබෙන්නේ එම දැනුම් පද්ධතියයි)

මෙම ආගන්තුක චින්තනය **ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය** යනුවෙන් හඳුන්වනු ලැබෙයි. (මෙහිදී ක්‍රිස්තියානි යන්න යොදා ගැනෙන්නේ හුදු ආගමික අර්ථයකින් නොවන බව අවධාරණය කළ යුතුය.) මෙම ආධිපත්‍ය කෙතරම් මහත් දැයි දැනෙන්නේ අද සමාජයෙහි අති බහුතරයකට එබඳු ආධිපත්‍යයක් ඇති බව වත් නොදැනීම තුළයි. මෙම ආධිපත්‍යය විසින් අනෙක් සියළුම දැනුම් නොදැනුම් බවට පත් කෙරී ඇත. ලොව ඇත්තේ එකම විද්‍යාවක් බවත්, ඒ අන් කිසිවක් නොව නවීන විද්‍යාව නමින් හඳුන්වන බටහිර විද්‍යාව බවත් අද අප ලබන අධ්‍යාපනය අපට කියා දෙයි. බටහිර විද්‍යාව සාමාන්‍ය ව්‍යවහාරයේදි යොදා ගැනෙන්නේ ‘බටහිර’ යන විශේෂණ පදය නොමැතිව යි. එනම් එකම ‘විද්‍යාව’ නම් එය යැයි හැඟෙන පරිදිය. අනෙක් සියළු දැනුම් පද්ධති හැඳින්වීමේදී ‘සාම්ප්‍රදායික’ (traditional), ‘දේශීය’ (indigenous) යනාදී විශේෂණ පද යොදා ගැනෙයි. මෙම විශේෂණ පද මගින් එම අන් දැනුම් එක්තරා කාලයකට හෝ දේශයකට පමණක් සීමා කෙරෙන අතර (බටහිර) විද්‍යාව කාලයෙන් හෝ දේශයෙන් ස්වායත්ත වූ, විශ්වයටම පොදු දැනුමක් ලෙස ඉගැන්වෙයි.

එම ඉගැන්වීමට අනුව අපේ පැරණි වෙදකම ‘පාරම්පරික වෙදකම’ වේ. අපේ ගොවියන්ගේ දැනුම ‘පාරම්පරික ශිල්ප ක්‍රම’ වේ. අපේ වැඩිහිටියන්ගේ දැනුම ‘හණ මිටි’ දැනුමක් වේ. මහදැනමුත්තා නම් චරිතය හරහා ගමට දැනමුතු කම් ලබා දුන් වැඩිහිටියන් හාස්‍යයකට ලක් කෙරුණු අතර, එම උපදෙස් පිළිගන්නා තරුණ කැළ මහදැනමුත්තාගේ මෝඩ ගෝල රැළට උපමා කෙරිණි. වැඩිහිටියන් උපදෙසක් ලබා දුන් විට එහි ඇති ඊනියා ‘විද්‍යාත්මක පදනම’ කුමක්දැයි තරුණයන් විසින් අසන තැනට පත් කෙරිණි. මෙලෙස විවිධ වූ ක්‍රියාමාර්ග ඔස්සේ බටහිර දැනුම් ආධිපත්‍යය අප වෙත (පොදුවේ මුළු ලොවටම) පටවනු ලැබිණි.

නමුත් දැයේ වාසනාවකට පහළ වූ පඬි රුවනක් විසින් මේ ආධිපත්‍යයද, එහි පදනමෙහි ඇති දුර්වලතාද පිරිසිඳ දැකිය හැකි පන්නරය අපට ලබා දෙන දැනුමක් නිර්මාණය කරන ලදී. ඒ අන් කිසිවකු නොව **නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය** නම් වූ සිංහල බෞද්ධ ඥානවිභාගය පිළිබඳ වූ ප්‍රවාදය නිර්මාණය කළ මහැදුරු නලින් ද සිල්වා යි. **සුසමාදර්ශය** (paradigm) නම් වූ සංකල්පයට වඩා ගැඹුරු වූ **චින්තනය** යන්නත්, දැනුම ඉන්ද්‍රිය පද්ධතියට, මනසට හා සංස්කෘතියට සාපේක්ෂ වන බවත්, ලොව විවිධ චින්තන ඇති බවත්, ඒවා මත පදනම්ව ඒ ඒ සංස්කෘතීන් විසින් දැනුම නිපදවන බවත් **නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය** මගින් ඔබට වටහා ගත හැකිය. මෙම දැනුම හරහා ඔබගේ බුද්ධියෙහි නිම් වළලු පුළුල් වූ විට ඉහතදී මතු කෙරුණු “ඔබ ලබන අධ්‍යාපනයෙහි පදනම කුමක්ද?” යන ප්‍රශ්නයෙහි අදාළත්වය සහ ගැඹුර වැටහෙයි.

උදාහරණයක් ලෙස, අයිසැක් නිවුටන් පඬිවරයා විසින් ගුරුත්වාකර්ෂණය “සොයා” ගන්නා ලද බවත් පොල් (හෝ ඇපල්) පොළොවට වැටෙන්නේ ගුරුත්වාකර්ෂණය නිසා බවත් ඔබ පාසැලේදි ඉගෙන ගනියි. “සොයා ගත්තා” යන්නෙන් ගම්‍ය වන්නේ ගුරුත්වාකර්ෂණය යනු සැබවින්ම “ඇති” දෙයක් බවත් එසේ ඇති දෙයක් නිවුටන් පඬිවරයා විසින් සොයා ගත් බවත් ය. එනමුත් පරමාර්ථ වශයෙන් ගත් කළ කිසිවක් නැති බවත්, අප “ඇති” යැයි ගන්නා සියල්ල සම්මුති පමණක් බවත් බුද්ධ ධර්මය අපට කියා දෙයි. හරයෙන්ම සිංහල බෞද්ධ පදනමක පිහිටා ඇති **නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය**, පොල් පොළොවට වැටෙන්නේ ගුරුත්වාකර්ෂණය නිසා නොව, පොල් පොළොවට වැටෙන නිසා ගුරුත්වාකර්ෂණය නම් වූ ප්‍රවාදය “නිර්මාණය” කෙරී ඇති බව අපට කියා දෙයි. එනම්, ගුරුත්වාකර්ෂණය යනු වස්තු පොළොවට වැටෙන අයුරු විස්තර කිරීමට “නිර්මාණය” කෙරුණු සංගත (consistent) ප්‍රවාදයක් මිස සැබෑවටම “ඇති” දෙයක් “සොයා” ගැනීමක් නොවන බව ය. (ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය නිර්මාණය කෙරී ශතවර්ෂ ගණනකට පසු අයින්ස්ටයින් පඬිවරයා විසින් ගුරුත්වාකර්ෂණය කියා දෙයක් නොමැති බවත් වස්තු පොළොවට වැටෙන්නේ අවකාශ-කාලය නම් දෙයක ඇති වක්‍රතාව නිසා බවත් කියවෙන වෙනත් ප්‍රවාදයක් නිර්මාණය කරන ලදී. ගුරුත්වාකර්ෂණය සැබෑවට ඇති දෙයක් නම් පසු කලෙක එවැන්නක් නැතැයි කීමට නොහැකි විය යුතුය.)

මේ අයුරින් අද අප ලබන සෑම දැනුමක්ම අප මත පැටවෙන්නේ එකම වාස්තවික (objective) සත්‍යය එය බවත් අන් සියළු දැනුම් නොදැනුම් බවත් ඒත්තු ගන්වමින්ය. මෙහි අවසන් ප්‍රතිඵලය වශයෙන් අප අපගේ සංස්කෘතිය හා සභ්‍යත්වය සමග ඓන්ද්‍රියව බද්ධ වූ අපේ දැනුම් පද්ධති, ඊනියා නවීන ලොවට ගැලපෙනවාදැයි ප්‍රශ්න කරන්නටත් ඉන් පසු ඒ නොගැලපේ යැයි කියා ඉවත දමන්නටත් පෙළඹවෙයි. මෙම දැනුම් ආධිපත්‍යයෙන් මිදී අපේම වූ ඇසකින් (ඥානසකින්) ලොව බලන්නට නම් අප අපේම වූ චින්තනය මත පදනම්ව නව දැනුම් නිර්මාණය කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය සංකල්ප, ප්‍රවාද හා දාර්ශනික පදනම මහැදුරු නලින් ද සිල්වා විසින් රචිත ‘මගේ ලෝකය’, ‘විද්‍යා කතන්දර’, ‘අපේ ප්‍රවාද - 1’ සහ ‘අපේ ප්‍රවාද - 2’ යන පොත් පෙළින් ඉතා සවිස්තරව ඉදිරිපත් කර තිබේ. මෙම මහාර්ඝ පොත් පෙළින් ඇරඹුණු බුද්ධිමය සංවාදය අද සමාජය සිසාරා විනිවිද යමින් තිබේ.

නිවන හරය කරගත් අපේ සංස්කෘතියේ බිහි වූ චිත්‍ර, මූර්ති, නැටුම් ආදී කලා ශිල්ප සියල්ලේම මුඛ්‍ය පරමාර්ථය වූයේ ජන සිත් නිවා සනසාලීම බවත්, මිනිසා යනු පරිසරයේ ස්වාමියා නොව එහිම කොටසක් යන ජීවන දර්ශනය පෙරදැරි කර ගත් අපේ පැරැණ්ණන් ගේ කෘෂිකර්ම හා ඉදිකිරීම් තාක්ෂණ සියල්ලම සොබා දම් චක්‍රය සමග ඓන්ද්‍රීයව බැඳුණු ඒවා බවත්, චතුස්කෝටික න්‍යාය (four state logic) මත පදනම් වූ අපේ බසෙහි අසිරියත් එහි පොහොසත් බවත් “අපේ ප්‍රවාද” පොත් පෙළින් නිරවුල්ව පෙන්වා දෙයි. අනෙක් අතට, පුද්ගලිකත්වය හා ඉන්ද්‍රිය පිනවීම මුල් කරගත් වත්මන් බටහිර සමාජ ආර්ථික රැල්ලත්, ඒ පසු පස එන විපරීත, කාමුක ජනප්‍රිය සංස්කෘතියත්, පරිසරයට ස්වාමිත්වය ආරූඪ කර ගනිමින් එය සූරාකන ධනවාදයත්, ද්වීකෝටික ඇරිස්ටෝටලීය න්‍යාය මත පදනම් වූ අපරදිග භාෂා වල ඇති සීමාත් ඔබට වැටහෙනු ඇත.

මෙම අවබෝධය ඔබට ඇති වූ විට, බටහිර බෙර පදවලට මිනිසුන් නැටවෙන්නේ එම කලා ශිල්ප වල අරමුණ ඉන්ද්‍රිය පිනවීම නිසා බවත්, අපේ බෙර හඬට එසේ නොවන්නේ අපේ කලා ශිල්ප මිනිසුන් නිවා සැනසීම උදෙසා නිසා බවත් දැනෙනු ඇත. (අපේ කලා ශිල්ප වල රස වින්දනය ඇත්තේම නැතැයි මින් නො කියවේ. ඒවා යේ අද ජනප්‍රිය සංස්කෘතිය මෙන් වල් බූරු රස වින්දනයක් නොතිබුණි.) එසේම, අද අපේ බෙර හඬ ජාත්‍යන්තරයට ගෙන යනවා යැයි කියමින් කරන්නේ එම පස් කම් සුව විඳින සමාජයට අවැසි පරිදි අපේ බෙර වැයීම බවත් අවබෝධ වනු ඇත. තවද, ‘අඩු වැඩිය’, ‘යමින් එමින්’ වැනි සිංහල යෙදුම් වලට සමාන යෙදුම් ඉංගිරිසියෙහි නැති බවත් එයට හේතුව ඉංගිරිසිය ද්වීකෝටික න්‍යායක පදනම් වූ චින්තනයක බිහිවීම බවත් ඔබ ඉගෙන ගනු ඇත. (ද්වීකෝටික න්‍යායක ‘අඩු’ හා ‘වැඩි’ දෙකම එකට පැවතිය නොහැකිය. More or less  යන ඉංගිරිසි යෙදුමෙන් කියන්නේ ‘අඩු හෝ වැඩි’ යන්නයි). මේ දැක්වූයේ ඉහත සඳහන් පොත් පෙළින් ඉදිරිපත් කෙරෙන අති මහත් වූ දැනුම් සම්භාරය ගැන උදාහරණ කිහිපයක් පමණි.

මෙහිදී ඉතා සංක්ෂිප්තව ඉදිරිපත් කළ පරිදි, ‘මගේ ලෝකය’, ‘විද්‍යා කතන්දර’ සහ ‘අපේ ප්‍රවාද’ පොත් පෙළ තුළින් අපගේ ඇස් වසා ඇති කඩතුරාවක් ඉරා දමා නැවුම් වූ අවබෝධයකින් යුතුව ලොව දකින්නට අපව සන්නද්ධ කරනු ලබයි. එම දැක්ම හරහා අප වහ වහා වටහා ගත යුතු වැදගත්ම කරුණ නම් ලොව ඇති සියළුම ගැටළු වලට එක චින්තනයක් මත පදනම් වූ එක් දැනුම් පද්ධතියකින් පමණක් පිළිතුරු සෙවිය නොහැකි බවත්, ඇත්තේ එකම විද්‍යාවක් පමණකැයි කියා අනෙක් දැනුම් පද්ධති තලා පෙලා දැමීම  සමස්ත මානව වර්ගයාටම විනාශකාරී වන බවත් ය. එසේම මෙම දැනුම් ආධිපත්‍යය හමුවේ නාය යන අපගේ හර පද්ධතීන් සුරැකීමටත්, මෙම අධිපති දැනුම් මගින් විසඳා ගත නොහැකි සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ගැටළු වලට පිළිතුරු සෙවීමටත් අප අදිටන් කර ගත යුතු යැයි ද අවසාන වශයෙන් කිව යුතුය. (මෙතැනදී සියළු ආකාරයේ බාහිර දැනුම් පද්ධති ප්‍රතික්ෂේප කළ යුතු යැයි නොකියවෙන බවත්, ආගන්තුක දැනුම් පද්ධති වල ඇති හරවත් දෑ අපට ගැලපෙන අයුරින් අවශෝෂණය කළ යුතු බව ජාතික චින්තන ගුරුකුලයේ ස්ථාවරය බවත් අවධාරණය කළ යුතුය.)

--

ඉෂාන් ද සිල්වා

ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව)

(2009 පෙබරවාරි 17)